ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 මැයි මස 11 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 මැයි**

2012 අප්‍රේල් මාසයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පදනම් වර්ෂය 2006/07) මගින් මනිනු ලබන උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.1 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 5.7 ක් විය. උද්ධමනය තවදුරටත් තනි අංකයක පවතින අතර ඉදිරි කාල පරිච්ඡේදය තුළ දී දේශීය මිල ගණන් අඩු මට්ටමක පැවතිය හැකි බව පිළිබිඹු කරමින් ඉදිරි දේශීය ආහාර ද්‍රව්‍ය සැපයුමෙහි යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. දේශීය කෘෂි නිෂ්පාදන සැපයුම පසුගිය වසර කිහිපය මුළුල්ලේ ඉහළ ගිය අතර, එය මිල ස්ථායීතාව පවත්වා ගැනීමට උපකාරී විය.

විදේශීය අංශය තුළ, මෑත දී ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන් පහත බැස ඇති අතර 2012 මාර්තු මාසයේ පැවති එ.ජ.ඩොලර් 120 ට සාපේක්ෂව බොරතෙල් බැරලයක මිල 2012 මැයි 10 වන විට එ.ජ.ඩොලර් 112.41 ක් දක්වා පහත බසින ලදී. ඛනිජ තෙල් මිල ඇතුළුව වෙළෙඳ ද්‍රව්‍යවල අන්තර්ජාතික මිල ගණන් මෙලෙස පහත බැසීම දිගින් දිගටම පවතින්නේ නම් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පවත්නා පීඩනය සැලකිය යුතු ලෙස අඩු වනු ඇත. මේ අතර මෙම වර්ෂයේ මුල් කාලය තුළ දී රජය සහ මහ බැංකුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් 2012 ඉදිරි කාලය තුළ දී ආනයන පරිමාවෙහි ඇතිවිය හැකි අඩුවීම ද දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි පවත්නා පීඩනය බොහෝදුරට අඩු කිරීමට උපකාරී වනු ඇත.

මුදල් අංශයෙහි වර්ධනයන් පිළිබඳව සලකන විට, දැඩි මුදල් ප්‍රතිපත්ති වාතාවරණය පිළිබිඹු කරමින් වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. පදනම් පොලී අනුපාතික වන භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ඉහළ ගොස් ඇති අතර, වාණිජ බැංකුවල මෙන්ම අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු හා ණය පොලී අනුපාතික ද ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. මේ අතර, සිය ණය වර්ධනය සියයට 18-23 ත් අතර ප්‍රමාණයක් දක්වා සීමාකිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බැංකු වෙත දන්වා ඇත. ඒ අනුව 2012 මාර්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය සියයට 22.8 ක් වුවද, වසරේ ඉදිරි කාලය තුළ මුදල් සමස්තයන්හි වර්ධනය සැලකිය යුතු ලෙස පහත බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ණයෙහි හා වෙළෙඳ හිඟයෙහි ප්‍රසාරණය සීමාකිරීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් බව 2012 මැයි 11 දින පැවැති මුදල් මණ්ඩල රැස්වීමේ දී මුදල් මණ්ඩලයේ මතය විය. මහ බැංකුව, වසරේ ඉදිරි කාලය තුළ මුදල් සමස්ත හා ආනයන වර්ධනය පහතබසිනු ඇතැයි අපේක්ෂා කරන අතර, මුදල් හා විදේශීය අංශයේ වර්ධනයන් සුපරීක්ෂා කාරී ලෙස අධීක්ෂණය කර අවශ්‍ය නම් ඉදිරි මාස තුළ දී තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ඇත. මේ අනුව මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7.75 ලෙස ද, ප්‍රති විකුණුම් අනුපාතිකය සියයට 9.75 ලෙස ද නොවෙනස්ව පවතිනු ඇත.

මීළඟට නියමිත ප්‍රතිපත්ති ප්‍රකාශය 2012 ජූනි 12 නිකුත් කිරීමට නියමිතය.